## ආදායම් බලපත්‍ර සම්බන්ධව ඔබ දැනගත යුතු දේ,

- ආදායම් බලපත්‍රය වර්ෂයක කාල සීමාවක් සඳහා නිකුත් කරයි.
- වාහනය ලියාපදිංචි කළ දිනය ආදායම් බලපත්‍රය ලබා ගැනීමේ ආරම්භක දිනය වේ.
- වාහනය මුල් ලියාපදිංචි දිනයේ සිටම වලංගු ආදායම් බලපත්‍රය ලබාගෙන තිබීම අනිවාර්ය වේ.
- නිකුත් කරන ලද ආදායම් බලපත්‍රයේ කොන්දේසි වලින් බැහැරව පළාත තුළ වාහනය පාවිච්චි නොකළ යුතු ය.
- වාහනය මාස 06 කට නොඅඩු කාල සීමාවකට පාවිච්චි නොකිරීමකට බලාපොරොත්තු වන්නේ නම් භාවිතා නොකරන බවට භාවිතා නොකිරීමේ නිවේදනයක් ලබා ගත හැක.
- වාහනයක හිමිකම පැවරීම සඳහා අයදුම්පත්‍රය භාරදී ලියාපදිංචි සහතිකය ලැබී නොමැති නම් ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී MTA11 හා CMT52 ආකෘතිපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.
- වාහනයේ සන්තකය (හිමිකම) ඔබගෙන් බැහැර වන සෑම අවස්ථාවකදීම නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නීත්‍යානුකූල කර ගත යුතු ය.

වැඩි විස්තර සඳහා

**නාරාහේන්පිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දුරකථන අංකය**

011-2694331-6

## ඔබ දන්නවාද?

" බස්නාහිර පළාතේ ලියාපදිංචි වාහන සඳහා බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලයෙන් හෝ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් (කොළඹ හා තිඹිරිගස්යාය හැර) ආදායම් බලපත්‍ර ලබා ගත හැකි බව"

"බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයට සතියේ දිනවල (පෙ. ව. 9.00 සිට ප. ව. 3.00) දක්වා පැමිණි වාහනයේ සිටම (On the Wheel) හෝ කවුළු මගින් ආදායම් බලපත්‍රය ලබා ගත හැකි බව"

**රජයේ ආයතන සතු වාහන ද ආදායම් බලපත්‍ර ලබා ගත යුතුයි.**

තැරැව්කරුවන්ට හසු නොවන්න.

ආදායම් බලපත්‍ර සම්බන්ධව මතුවන ඕනෑම ගැටළුවකදී මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය විමසන්න.

දුරකථන අංක

| | |
|---|---|
| කොමසාරිස් | 011 - 2446870 |
| සහකාර කොමසාරිස් | 011 - 3056335 |
| ගණකාධිකාරී | 011 - 3056334 |
| කාර්යාලය | 011 - 2436415 |

# මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් (බස්නාහිර පළාත)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය

" 1991 අංක 07 දරන බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ අංක 2 (1) අනුව, බස්නාහිර පළාතේ මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් හෝ ප්‍රාදේශීය ලේකම් මගින් නිකුත් කරන ලද ආදායම් බලපත්‍රයක් බලාත්මකව (වලංගුව), නොමැතිව මෝටර් වාහනයක් කිසිම තැනැත්තෙකු විසින් පළාත තුළ සන්තකව තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය."

## " බලපත්‍රයේ වලංගු කාලය අවසන් වන තෙක් නොසිටින්න" බලපත්‍රය අවසන් වන දිනට මාස 3 ක් ඇතුළත නව බලපත්‍රය ලබාගත හැක.

ලිපිනය:

**මෝටර් රථ ප්‍රවාහන පළාත් කොමසාරිස් කාර්යාලය,**

(බස්නාහිර පළාත)

පළමු මහල, මහ ලේකම් කාර්යාලය,

මාළිගාවත්ත, කොළඹ 10.

දුරකථන: 011- 2436415

ඊමේල් : motertraffic.westernprovince@gmail.com